Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර කලාව

ඔක්තෝබර් 02 සතිය

ශ්‍රේණිය - 10 (III වාරය)

සැකසුම - සිතාරා විජේරත්න (සිරිසමන් ජා. පා.)
දැරණියගල කොට්ඨාසය

පාඩම/ ඒකකය - 7.2.4 දඹුලු විහාර චිත්‍ර

## ඉගෙනුම් අත්වැල

### දඹුලු විහාර චිත්‍ර

- ක්‍රි.පූ 1 වන සියවස වළගම්භා රජු විසින් ඉදිකරන ලද්දකි.
- විශිෂ්ඨ සිතුවම් හා මූර්ති ඇතුළත් ලෙන් 5කින් යුතු ගුහා සංකීර්ණයකි.
  1. දේවරාජ ලෙන
  2. මහා රාජ ලෙන
  3. මහා අලුත් විහාරය
  4. පශ්චිම විහාරය
  5. දෙවන අලුත් විහාරය

- දඹුලු විහාර සිතුවම් අතර අනුරාධපුර යුගයට අයත් යැයි සැලකෙන කොටසක්ද ඇතුළුව බහුතරය මහනුවර යුගයට අයත් මහනුවර චිත්‍ර සම්ප්‍රදාය නියෝජනය කරයි.
- දඹුලු විහාර සිතුවම් ඇඳිමේ ගෞරවය හිමි වන්නේ නීලගම සිත්තර පරම්පරාවටය.
- දඹුලු විහාර සිතුවම් හි වස්තු විෂය වන්නේ,

1. බෝධි සත්ව චරිත අවස්ථා - සූවිසි විවරණ
2. බුද්ධ චරිත අවස්ථා - මාර පරාජය, ජේතවන පූජාව
3. ඓතිහාසික සිද්ධි - ශ්‍රී මහා බෝධිය වැඩමවීම, මහින්දාගමනය



දඹුලු ලෙන් විහාර සංකීර්ණය



බුද්ධ ප්‍රතිමා හා දේව ප්‍රතිමාවක් (සුමන සමන් දෙවියන්)

| චිත්‍ර ලක්ෂණ |
| --- |
| 1. පාර්ශව දර්ශි රූප<br>2. තීරු චිත්‍ර සංරචන වල අඛණ්ඩ කථන ක්‍රමය<br>3. ද්විමාන ලක්ෂණ සහිත පැතලි වර්ණ<br>4. වියළි බදාමය මත සිතුවම් ඇඳීමේ ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමය<br>5. රූප වටා නිමාව දක්වන ප්‍රශස්ත මට්ටමේ රේඛාකරණය<br>6. පසුබිම් වර්ණය ලෙස මදටිය රතු වර්ණය යෙදිම.<br>7. කහ, කොළ, රතු, කළු, සුදු වර්ණ භාවිතය<br>8. පසුබිමේ හිස්තැන් පිරවීමට සාම්ප්‍රදායික මල් හෝ ස්තර (නෙළුම් මල. වැටකේ මල, පිච්ච මල) යෙදීම.<br>9. සමස්ත සංරචනය තුළ පරිමාණ හා පරියාවලෝකණ රීති නොසැලකීම. |



බුද්ධත්වයෙන් පස්වන සතිය-මාර දූවරු පරාජය කිරීම



මාර පරාජය සිතුවමේ කොටසක්



දහසක් බුදුවරුන්ගේ රූප



අනෝතප්ත විල

- ලබා දී ඇති ප්‍රශ්ණ සඳහා කෙටි පිළිතුරු සපයන්න.

1. දඹුල්ල ලෙන් සංකීර්ණය නිර්මාණය වුයේ කිනම් රජ දවසද?
2. දඹුලු විහාර චිත්‍ර කුමන චිත්‍ර සම්ප්‍රදායක් නියෝජනය කරයිද?
3. දඹුලු විහාර  සිතුවම් ඇඳි සිත්තර පරම්පරාව නම් කරන්න
4. මෙම සිතුවම් ශීල්ප කලාව කුමක්ද?
5. දඹුලු විහාර සිතුවම් හි පසුබිම් වර්ණය කුමක්ද?

**ඇගයීම**

1. දඹුලු විහාර සිතුවම් හි දක්න්ට ලැබෙන සුවිශේෂී සිතුවම් දෙකක් නම් කර ඒවාහි

- ශෛලිය
- ශිල්ප ක්‍රමය
- වර්ණ භාවිතය
- රේඛාකරණය
- තලය භාවිතය
- භාව ප්‍රකාශනය
- සුවිශේෂතා කෙටියෙන් හඳුන්වන්න